## තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා ව මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2006 සිට 2008 වර්ෂය දක්වා කාලය තුළදී ආයතන 7 කට ලබාදී තිබුණු රු.1,529,862 ක් වූ මූල්‍යාධාර සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා එම මූල්‍යාධාර නැවත ලබා ගත යුතු මුදල් ලෙස ගිණුම්වල දැක්විය යුතු වුවත්, එලෙස කටයුතු කර නොතිබුණි. මීට අමතරව ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මධ්‍යස්ථාන 12 කට පාඨමාලා සඳහා උපකරණ ලබා ගැනීමට රු.3,360,399 ක් ලබා දී තිබුණු අතර ඉන් වියදම් නොකළ රු.1,414,588 ක් ලැබිය යුතු මුදල් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(ආ) ප්‍රකාශන අලෙවි ආදායම රු.389,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.493,539 ක් වූ ශිෂ්‍ය ප්‍රගති වාර්තා පොත් තොගය සහ රු.2,557,490 ක් වූ තැන්පතු හා ලැබිය යුතු ශේෂයන් පරීක්ෂා කිරීමට අදාල, උපලේඛන, ශේෂ සනාථ කිරීම් සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා ආදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය<br>XIV වන පරිච්ඡේදයේ 4.5 වගන්තිය | ගමන් වියදම් ගෙවීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සංයුක්ත දීමනාවල සීමාවන් නොසලකා ගෙවීම් කිරීම නිසා අවස්ථා 13 ක දී එකතුව රු.14,649 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (ආ) | (i.) 1994 අගෝස්තු 3 දිනැති අංක 26/92 (1) හා 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 | වෙන්කල වාහන හැර ඉතිරි රජයේ සියළුම වාහනවල රාජ්‍ය ලාංඡනය සහ සභාවේ නම සටහන් කර නොතිබුණි. |
| | (ii.) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛයේ 1.3.1(iii) ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දිය යුතු නිලධාරීන් 6 දෙනෙකුට, වෙන් වෙන්ව ගමන් කිරීම සඳහා වාහන ලබා දී තිබුණි. |
| | (iii.) 2008 ජූනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 07 ඡේදය | කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැපයීමේදී යාම් ඒම සඳහා උපරිම දුර කි. මී 50 ක් ලෙස දක්වා තිබුණත් නිලධාරීන් දෙදෙනෙකු සඳහා එම සීමාවන් ඉක්මවා ප්‍රවාහන පහසුකම් සපයා තිබුණි. |

(ඇ) 2003 ජුනි 2 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | |
|---|---|
| (i) 5.2.1 වගන්තිය | 2009 වර්ෂයේ සිට සකස් කළ අයවැය ලේඛනය සමග පුරෝකථනය කළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 8.3.5(අ) වගන්තිය. | "සී" ශ්‍රේණියේ සංස්ථාවක නිල වාහන වෙන්කළ හැක්කේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරි හා විධායක අධ්‍යක්ෂකවරයන් සඳහා පමණක් වුවද, එම විධිවිධානවලට පටහැනිව "සී" ශ්‍රේණිය යටතට ගැනෙන සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල්වරයාට, වෙන්කළ වාහනයක් ලබාදී ඒ සඳහා 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂයකට රු 165,600 බැගින් රු.496,800 ක ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොම්පන් සභාවේ මෙහෙයුම් කටයුතුවලින් පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනයට පෙර

රු.1,495,496 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,575,803 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 80,307ක පිරිහීමක සඳහා භාණ්ඩාගාර ප්‍රදාන අඩුවීම හා වියදම්වල වැඩිවීම යන කරුණු බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### 3.1.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයන් ළඟා කර ගැනීමට කොමිෂන් සභාව සමත් වී නොතිබූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ වෘත්තීය පුහුණු ආයතනවල පාඨමාලා 35 කට මූල්‍යාධාර සැපයීමට රුපියල් මිලියන 5 ක ප්‍රතිපාදන සලසා තිබුණද, මූල්‍යාධාර සපයා තිබුණේ පාඨමාලා 19 කට පමණි. පාඨමාලා 35 කට මෙම මුදල් ලබා දීමට අපේක්ෂා කළත් එම ආයතනවල පාඨමාලා සඳහා ඇති උපකරණ අපේක්ෂා කළ මට්ටමකට වඩා පහත මට්ටමක පැවතීම නිසා එක් එක් පාඨමාලාවන්ට වැඩිපුර මුදල් ප්‍රමාණයක් වෙන් කිරීමට සිදුවීමෙන් මෙම තත්ත්වය ඇතිවූ බව සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2013 මැයි මාසයේදී විගණනය වෙත වාර්තා කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ආයතන 225 ක ලියාපදිංචිය අලුත් කිරීමට සැලසුම් කර තිබුණද ආයතන 211 ක පමණක් ලියාපදිංචිය අලුත් කර තිබුණි. එය ඉලක්කගත අගයෙන් සියයට 93.8 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරීම සඳහා වූ ඉලක්කයන් ලැබූ අයදුම්පත්, ඇගයීම් කළ හා ප්‍රතීතනය කළ සංඛ්‍යාවන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| පුහුණුව සපයන ආයතනය | ඉලක්ක ගත පාඨමාලා සංඛ්‍යාව | අයදුම්පත් ලද පාඨමාලා සංඛ්‍යාව | ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය කරනු ලැබූ පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය කරන ලද පාඨමාලා සංඛ්‍යාව ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය | 400 | 31 | 27 | 18 | |
| ජාතික තරුණ සේවා සභාව | | 45 | 66 | 31 | |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | | 21 | 45 | 26 | |
| ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය | | 138 | 244 | 130 | |
| වෙනත් රාජ්‍ය ආයතන | | 53 | 27 | 9 | |
| | | 288 | 409 | 214 | 52 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 50 | 89 | 89 | 57 | 64 |
| | 450 | 377 | 498 | 271 | |

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පුහුණු පාඨමාලා ප්‍රතීතනය අලුත් කිරීම සඳහා පුහුණුව සපයන ආයතනවලින් ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව, ඇගයීම් කරන ලද සංඛ්‍යාව හා ප්‍රතීතනය අළුත් කරන ලද සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| පුහුණුව සපයන ආයතන | ඉලක්ක ගත පාඨමාලා සංඛ්‍යාව | අයදුම්පත් ලද පාඨමාලා සංඛ්‍යාව | ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය අලුත් කරන ලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය අලුත් කරන ලද පාඨමාලා සංඛ්‍යාව ඇගයීම් කරන ලද සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස(%) |
|---|---|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය | 96 | 02 | 05 | 04 | |
| ජාතික තරුණ සේවා සභාව | | - | 09 | 06 | |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | | 19 | 25 | 20 | |
| ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය | | 26 | 40 | 38 | |
| වෙනත් රාජ්‍ය ආයතන | | 04 | - | - | |
| | | 51 | 79 | 68 | 86 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 57 | 28 | 41 | 35 | 85 |

(ඉ) ජාතික වෘත්තීය සුදුසුකම් අංශය

ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතිය ව්‍යාප්ත කිරීම හා පවත්වාගෙන යාම සඳහා ඇගයුම්කරුවන්ට බලපත්‍ර 200 ක් නිකුත් කිරීමට ඉලක්ක කර තිබුණද, සත්‍ය වශයෙන් නිකුත් කර තිබුණේ බලපත්‍ර 76 ක් පමණි.

(ඊ) 2012 වර්ෂයේ සංයුක්ත සැලැස්මට අනුව දිවයින පුරා පවත්වා ගෙනයන පුහුණු ආයතන පිළිබඳ සමීක්ෂණයක් කිරීමට සැලසුම් කර තිබුණද , එය සිදුකර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) මූල්‍යාධාර පිරිනැමීම**

(i) ඉකුත් වර්ෂයේ මූල්‍යාධාර ලබාදුන් රාජ්‍ය ආයතන , පෞද්ගලික ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන 10 ක් විසින් ගිවිසුම් ප්‍රකාරව උපකරණ මිලදීගැනීම, ප්‍රතිනතය කිරීම, පාවිච්චි නොකළ මුදල් ආපසු එවීම වැනි කරුණු ඉටු නොකළ අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ආයතනය | ලබාදුන් මූල්‍යාධාර වටිනාකම |
|---|---|
| | රු. |
| ජාතික තරුණ සේවා සභාව | 3,103,030 |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 7,382,110 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 4,119,919 |
| කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව | 383,850 |
| ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය | 2,000,000 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 2,137,258 |

(ii) 2006 සිට 2010 වර්ෂය දක්වා දිස්ත්‍රික්ක 15 ක රාජ්‍ය අංශයේ පාඨමාලා 68 ක් ප්‍රතිනතය සඳහා ලබාදෙන ලද රු.19,213,747 ක්වූ මූල්‍යාධාරවලට අදාල පාඨමාලා 2013 මාර්තු මාසය වන විටත් ප්‍රතිනතය කර නොතිබුණි.

(ආ) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තිය අධ්‍යාපන පනතේ 14 වගන්තිය අනුව වෘත්තිය හා කාර්මික පුහුණු ආයතන ලියාපදිංචි කිරීම හා කාලීනව නැවත අලුත් කිරීම කළ යුතුය. සභාව පිහිටවූ දින සිට ආයතන 2,300 ක් ලියාපදිංචි කර තිබුණත්, 2012 වර්ෂයේ ලියාපදිංචිය අලුත් කර තිබුණේ ආයතන 809 ක් පමණි.

(ඇ) 2010, 2011 හා 2012 වර්ෂවලදී රු. 1,955,835 ක් වැය කර පර්යේෂණ 20 ක් සිදු කර තිබුණද, අවශ්‍යතා තීරණය නොකිරීම, ප්‍රවීනත්වයක් ඇති පුද්ගලයන් නොයෙදීම, වාර්තාවන් ක්‍රියාත්මක නොකිරීම, පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් නොකිරීම, සභාවේ නිලධාරීන් සිදු කරන පර්යේෂණ සඳහා ගිවිසුම් අත්සන් නොකිරීම, නියමිත කාල සීමාවන් තුළ වාර්තා ඉදිරිපත් නොකිරීම, පර්යේෂණ අධීක්ෂණයට වෘත්තිය හා කාර්මික විශ්ව විද්‍යාලයට භාරදී තිබුණත් එය සිදු නොවීම, වැනි කරුණු නිසා පර්යේෂණ සිදු කිරීම මගින් සභාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා වූ දායකත්වය ප්‍රමාණවත් වී නොතිබුණි.

(ඈ) විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය සංචාරක හෝටල් කර්මාන්තය වෙනුවෙන් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් කිරීම (VET PLAN) සම්බන්ධයෙන් පිළිවෙලින් මොරටුව විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සමඟ ඇතිකර ගත් ගිවිසුම අනුව අදාළ වාර්තා සකස් කර භාරදීම පිළිවෙලින් මාස 7ක් හා වසරක් ප්‍රමාද වී තිබුණද ගිවිසුමේ, කොන්දේසි ප්‍රකාරව අයකල යුතු පිළිවෙලින් රු.105,000 ක සහ රු.205,920 ක ප්‍රමාද ගාස්තු අය කිරීමට නටයුතු කර නොතිබුණි.

## 3.3 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් කොමිෂන් සභාවේ සම්පත්

2003 ජුනි 02 දින හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව 2012 ජනවාරි 02 දින බඳවා ගන්නා ලද සේවකයකු, බඳවාගත් දින සිටම රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.328,302 ක් සභාව විසින් ගෙවා තිබුණි.

## 3.4 කාර්යය මණ්ඩල පරිපාලනය

කොම්ෂන් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| විධායක ශ්‍රේණිය | 31 | 23 | 8 | 26 | 23 | 3 |
| ලිපිකරු හා සමාන්තර සේවා | 32 | 26 | 6 | 30 | 22 | 8 |
| කණිෂ්ඨ | 19 | 16 | 3 | 17 | 16 | 1 |
| අනියම් හා තාවකාලික | 01 | 01 | - | 01 | 01 | - |
| | 83 | 66 | 17 | 74 | 62 | 12 |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සංශෝධනය කර තිබුණු අතර, එකී සංශෝධිත අයවැය ලේඛනයේ ඇතුළත් සංඛ්‍යාවන් සහ තථ්‍ය සංඛ්‍යාවන් අතර, විචලනය සියයට 15 සිට සියයට 56 ක පරාසයක වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) වාහන උපයෝජනය

(ඈ) සේවක මණ්ඩල කළමනාකරණය

(ඉ) අයවැය පාලනය